නුවරඑළිය ප්‍රාදේශීය සභාව

නුවරඑළිය දිස්ත්‍රික්කය

-----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 11 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 පෙබරවාරි 20 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 26 දින ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

1.3.1 නොසැසඳූ පාලන ගිණුම්

-----------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ශේෂ 4 ක වටිනාකම එම ගිණුම් ශේෂ වලට අදාල උපලේඛන සමඟ සැසඳීමේදී රු.64,203,103 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.2 අවිනිශ්චිත ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය රු.67,129,574 ක් වූ අතර, එම ශේෂය 2014 වර්ෂයේ සිට නිරවුල් නොකර පැවැතුණි.

1.3.3 ලැබිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 4 ක කාල පරාසයක් ගතවී ඇති, ලැබිය යුතු සේවා සඳහා ගාස්තු රු.487,574 ක් අය කරගෙන නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.18,109,956 ක ගිණුම් විෂයයන් 02 ක් උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) සහ (ආ) වගන්ති, 159 (1) සහ (2) වගන්ති | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.8,605,598 ක හිඟ ආදායම් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ආ). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 (2) | යම් කාර්යයක් සඳහා දෙන ලද අතුරු අග්‍රිමයක් එම කාර්යය නිමවූ වහාම පියවිය යුතු වුවද, 2009 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ අවස්ථා 34 කදී විවිධ කාර්යයන් සඳහා සභාවේ නිලධාරීන්ට සහ බාහිර පාර්ශවයන්ට දෙන ලද රු.18,586,147 ක අතුරු අග්‍රිම 2017 ජූලි 28 වන දින වනවිටද පියවා නොතිබුණි. |
| (ඇ). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 4.3.3 වගන්තිය | සභාවේ නිවාස නිලධාරීන්ට/ සේවකයන්ට වෙන්කර දීමට අදාලව පොරොත්තු ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි |
| (ඈ). පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය | වරිපනම් බදු සඳහා දේපළ තක්සේරුවක් වසර 05 කට වරක්වත් සිදුකල යුතු වුවද, සභාව 2009 වර්ෂයට පසු දේපළ තක්සේරු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.38,575,088 ක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.53,862,805 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු.15,287,717 ක පසුබෑමක් සිදුවී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
-------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ රු.15,287,717 ක පසුබෑමට ආදායම් විෂයක ආදායම අඩුවීම හා වියදම් විෂයයන් 5 ක වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය
-------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම අනුපාතය 2:1 ක් ලෙසට පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------

සභාවේ නැණ පියස ඒකකය සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). නැණ පියස ඒකකය පවත්වාගෙන යාම සඳහා පරිගණක 3ක් ඇතුළු අනෙකුත් භාණ්ඩ මධ්‍යම පළාත් සභාවෙන් 2014 ජූනි 13 දින ප්‍රාදේශීය සභාවට ලැබී තිබූ නමුත්, ඉන් එක් පරිගණකයක් 2017 අගෝස්තු 16 දින වන විටද ප්‍රයෝජනයකට නොගෙන පුස්තකාලයේ රඳවා තිබුණු අතර, ඉතිරි භාණ්ඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ සහ පුස්තකාලයේ ප්‍රයෝජනයට ගෙන තිබුණි.

(ආ). නැණ පියස ඒකකය සඳහා ගොඩනැගිල්ලක් පිළිසකර කිරීමට රු.594,519 ක් වැය කර තිබුණු අතර, එම ගොඩනැගිල්ලද ප්‍රයෝජනයකට නොගෙන වසා දමා තිබුණි.

3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

වසර 01 – 09 අතර කාලයක් භාවිතයෙන් ඉවත්කර ඇති යතුරු පැදි 03 ක් හා ට්‍රැක්ටර් රථයක් අළුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරිමට කටයුතු නොකර සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ). කඳපොල නගරයේ සහ අවට ප්‍රදේශවලින් දෛනිකව රැගෙන එන මිශ්‍ර කසළ නුවරඑළිය - රාගල ප්‍රධාන මාර්ගය අසල විවෘත භූමියක අවිධිමත්ව බැහැර කරමින් පැවතුණි.

(ආ). නානුඔය ප්‍රදේශයේ කසළ වර්ග කිරීමකින් තොරව එකතු කිරීම කරන බව නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 11 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 පෙබරවාරි 20 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

4.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් සැසඳීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට 26 සිට සියයට 387 දක්වාද, වියදම් විෂයයන් 06 ක සියයට 17 සිට සියයට 99 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ). | ආදායම් පරිපාලනය. | සභාවට ලැබිය යුතු හිඟ ආදායම් අයකරගෙන නොතිබීම. |
| (ආ). | ණයගැති/ ණයහිමි පාලනය | සභාවට ලැබිය යුතු මුදල් නිරවුල් කරගැනීම සහ සභාව විසින් ගෙවිය යුතු මුදල් නිරවුල් කර නොතිබීම. |
| (ඇ). | වත්කම් පාලනය | සභාවට අයත් වත්කම් මනාව නඩත්තුකර නොතිබීම. |
| (ඇ). | ගිණුම්කරණය | ගිණුම් වර්ෂයට අදාළ වත්කම් සහ බැරකම් ගිණුම්ගත කිරීමේදී විවිධ අඩුපාඩු සිදුවී තිබීම. |